# අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ශ්‍රී ලංකා ජනාධිපතිතුමා අතර පැවති දුරකථන සාකච්ඡාව

*ඉන්දීය පුවත්පත් තොරතුරු කාර්යාංශය විසින් 2020 මැයි 23 වන දින නිකුත් කරන ලදී*

අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා අද දින ශ්‍රී ලංකා ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සමඟ කොවිඩ්-19 වසංගත තත්වය සහ එයින් කලාපය තුළ මතු විය හැකි සෞඛ්‍යමය සහ ආර්ථික බලපෑම් පිළිබඳව දුරකථන සාකච්ඡාවක නිරත විය.

මෙම වසංගතයේ බලපෑම් අවම කර ගැනීම සඳහා ඉන්දියාව තවදුරටත් ශ්‍රී ලංකාවට හැකි සෑම සහයෝගයක්ම ලබා දෙන බවට අග්‍රාමාත්‍යතුමා ශ්‍රී ලංකා ජනාධිපතිතුමාට සහතික විය.

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ආර්ථික කටයුතු යළි ඇරඹීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති පියවර පිළිබඳව අග්‍රාමාත්‍යතුමා දැනුවත් කළේය. මෙම පසුබිම තුළ නායකයන් දෙපළම ඉන්දීය ආධාර යටතේ ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘතීන් වේගවත් කිරීමට එකඟ විය. ඉන්දියාවේ පෞද්ගලික අංශය විසින් ශ්‍රී ලංකාව තුළ ආයෝජන සහ අගය එකතු කිරීම ප්‍රවර්ධනය කිරීමෙ හැකියාවද මෙහිදී සාකච්ඡා කෙරිණ. එසේම අග්‍රාමාත්‍යතුමා ශ්‍රී ලාංකික ජනතාවගේ නිරෝගීභාවය සහ සුබසිද්ධිය උදෙසා සිය ප්‍රාර්ථනා එක් කළේය.

****

VRRK/KP